
# ඉරුණු ගවුම



වෙනුති දුල්දිනි කුමාරි දිසානායක

**කර්තෘගේ වෙනත් කෘති**

**ළමා කතා**

**මී කිරි හට්ටිය - 2024**

**ඉරුණු ගවුම**

**ඩී.එම්. වෙනුති දුල්දිනි කුමාරි දිසානායක**

**පළමු මුද්‍රණය - 2025 පෙබරවාරි**

ISBN - 978-624-208-287-5

# පිදුම

පුංචි පැළ දළු දමා
මල් පිපී පූදින්න....
රන් අස්වනු නෙළා
මුළු ලොවම සරු වෙන්න...
නැණ ගුණ දම් සපිරි
දියණියන් තනන්නට...
මහාමායා පින්කෙත තැනූ
පූජ්‍ය කරඳන අත්ථදස්සී
නාහිමිපාණෙනි...,
ගෞරවණීය ආදීකර්තෘනි....,
මාගේ මේ පුංචි වෑයම
උපහාරයක්ම වේවා ඔබට.....!

# ස්තුතිය

තබන තබන පා පියවර
සෙනෙහෙ දියෙන් නහවාලා...
ගුණත් නැණත් එක නූලක
අමුණා ගෙළ පළඳාලා...
ලොව දිනුමට මග සරසන
මහාමායා විදු මාතා....
මා ආදර ගුරු දෙගුරුන්
පාද නමැද බැති පෙමිනා....
තුත් පුදනෙමි පුංචි මෙමා
හද තුළ පිරි සෙනෙහසිනා.....

ඩී.එම්. චෙනුති දුල්දිනි කුමාරි දිසානායක
3 ශ්‍රේණිය ඩී
මාහාමායා බාලිකා විදුහල - මහනුවර.



# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන ''හෙරණගත්කරණී'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එකමත් එක ගමක හිටියා ලිනුති කියලා පුංචි ගැහැනු ළමයෙක්. ලිනුති කියන්නේ දෙමාපියන්ට හරිම කීකරු බොහොම ආදරණීය දරුවෙක්.

එයා ජීවත්වුණේ එයාගේ අම්ම යි තාත්තා යි එක්ක.



එයාට පුංචි, ලස්සන, හුරතල් පූස් යාළුවෙකුත් හිටියා. එයාලගේ ගෙදර පුංචි ලස්සන ගෙදරක්. එයාලා ඒ ගෙදර හරිම පිරිසිදුව තමයි තියා ගත්තේ.

ගෙදර මිදුල හරියට මල් වත්තක් වගේ. මිදුල පුරාම ලස්සන, සුවඳ, පාට පාට මල් ගොඩක් වවලා තිබුණා. ඉතින් මෙයාලගේ ගෙවත්තට මී මැස්සෝ, සමනල්ලු, පුංචි කුරුල්ලෝ නිතරම එනවා.

ලිනුති යි අම්ම යි මේ මල් ගස් හරිම ආදරයෙන් තමා බලා ගත්තේ. එයාලා ගස්, වැල්, මල්, පුංචි පුංචි ලස්සන සත්තු දිහා බලලා සතුටු වුණා.



ලිනුතිගේ තාත්තට ස්ථිර රැකියාවක් තිබුණේ නැහැ. ඉතින් එයාලා ගොඩක් අගහිගකම් මැද්දේ තමයි ජීවත් වුනේ.

ඒත් එයාලා ලැබෙන දෙයින් සතුටු වෙන්න පුරුදු වෙලා හිටියා. ඒ නිසා ලිනුතිගේ පවුලේ අය හරිම සතුටින් සමඟියෙන් තමයි ජීවත් වුනේ.



දවසක් රෑ ලිනුති නින්දට ගියාම
අම්මා යි තාත්තා යි කතා වුනා
දුවගේ උපන්දිනය ළඟ ළඟම
එනවා නේද කියලා.

'' දුවට ගොඩක් කාලෙකින් අලුත්
ගවුමක් අරන් දෙන්නත් බැරි වුනානේ.
අපි දුවට අලුත් ගවුමක් අරන් දෙමු.''
කියලා තාත්තා කිවුවා.

අම්මත් ඒකට කැමති වුනා.
අම්මා කිවුවා '' ගවුම් රෙද්දක්
ගෙනත් දුන්නා නම්, මට දුවගේ
ගානටම ලස්සනට ගවුම
මහන්න පුළුවනි.'' කියලා

තාත්තා ලස්සන ගවුම් රෙද්දක් ඊළඟ
දවසේ ම ගෙනාවා. අම්මා, ලිනුති
පාසල් ගියාම ලස්සනට ගවුම මැහුවා.

ලිනුතිගේ උපන්දිනය දවස ආවා.
එදා පාසල් නිවාඩු දිනයක්.
ලිනුති උදේම නැඟිටලා මුහුණු
සෝදා මල්, පහන්, සුවඳ දුම්
පූජා කර බුදුන් වැන්දා.




අම්මා රස ම රස කිරිබත්, ලුණු මිරිස් සමඟ කෙසෙල් තබා මේසය පිළියෙල කර තිබුණා. අම්මා ත් තාත්තා ත් ලිනුතිට ආදරෙන් කිරිබත් කැවුවා. ලිනුති හරිම සතුටින් කිරිබත් කෑවා. අම්ම යි තාත්තා යි ලිනුතිට ගවුම තෑගි කළා.



ලිනුති අම්මාට ත් තාත්තාට ත් වැන්දා. අම්මා ත් තාත්තා ත් ලිනුතිගේ හිස සිප නිරෝගී දීර්ඝායුෂ පතා ආශිර්වාද කළා.

ලිනුති හරිම සතුටින් ගවුම ඇන්දා. ඒක රතු පාට ගවුමක්. කහ පාට පුංචි පුංචි මල් ගවුම පුරාම විසිරිලා තිබුණා. ඒකටම ගැළපෙන රේන්දයකුත් අල්ලලා තිබුණා.

ලිනුති ගවුම ඇඳගෙන රවුමක් කැරකිලා උඩ පැන පැන හිනා වුණා. ලිනුති ගවුම ඇඳගෙන ගේ වටේ ඇවිද්දා. නට නටා සිංදුවකුත් කිවුවා. ලේනුන්ට, කුරුල්ලන්ට, සමනලුන්ටත් අලුත් ගවුම පෙන්නුවා.



එයාගේ හුරතලා වුණ පුංචි කිට්ටත්
අලුත් ගවුමේ හැඩ පෙන්නුවා.
කිටි පැටියත් සතුටින් ලිනුතිගේ ගවුම
වටේ කැරකි කැරකි පුරු පුරු ගැවා.




ලිනුකි හරිම ආඩම්බරයෙන්
''මගේ අම්මා තමයි මට මේ ගවුම
මහලා දුන්නේ'' කියලා යාළුවන්ට කිවුවා.

යාළුවොත් ලිනුතිගේ සතුට දැකලා සතුටු වුනා. ඇත්තටම ඒ ගවුම හරිම ලස්සනයි කියලා යාළුවෝ හැමෝම කිවුවා. ලිනුති මුළු දවසම ඒ ගවුම ඇඳගෙන හිටියා.

ඊළඟ සෙනසුරාදා දවස ආවා. ලිනුති උපන්දිනය දා තෑගි ලැබුණ ලස්සන ගවුම ආසාවෙන් ඇන්දා.

ලිනුති අම්මාගෙන් අවසර අරගෙන යාළුවොත් එක්ක සෙල්ලම් කරන්න ගියා. එදා එයාලා ඔංචිලි පදින්න හිතුවා. වත්ත පහළ හදලා තිබුණ ඔංචිල්ලාව ළඟට හැමෝම දිව ගියා. එයාලා හරිම සතුටින් සෙල්ලම් කළා.



ලිනුති ඔංචිලි පදිමින් සිටින විට
ඔංචිල්ලාවේ ලණුවටත් ලෑල්ලටත්
ගවුම හිරවුණා. හිරවුණු ගවුම
ගලවාගන්න ලිනුති උත්සහ කළා.
එයාට යාළුවොත් උදවු වුණා.
එත් ගවුම පරිස්සමට ගලවාගන්න
එයාලට බැරි වුණා. අනේ !
ලස්සන ගවුමේ පැත්තක්ම ඉරුණා.

ලිනුතිට හරිම දුක හිතුණා.
එයා අඬන්න ගත්තා.
යාළුවන්ටත් හරිම දුකයි.

ලිනුති අඬ අඬාම ගෙදර ගියා. අම්මා එක්ක වුණ දේ කිවුවා. ලිනුති ගැන අම්මටත් දුක හිතුනා. ලිනුති හවස් වෙනකම්ම ඇඬුවා. ලේනුන්ටත් කුරුල්ලන්ටත් සමනලුන්ටත් ලිනුති එයාගේ ඉරුණු ගවුම පෙන්නලා දුක කිවුවා. එයාලත් දුකෙන් ලිනුති දිහා බලන් හිටියා.

පුංචි කිටි පැටියා තුරුළු කරන් ලිනුති එයාටත්, එයාගේ ඉරුණු ගවුම පෙන්නුවා. කිටි පැටියත් ලිනුතිගේ මුහුණ දිහා දුකෙන් බලාගෙන හිටියා.



තාත්තා එනකම් මඟ බලාගෙන
හිටිය ලිනුති, තාත්තාටත්
ඉරුණු ගවුම ගැන කිවුවා.

ඒ කියද්දිත් ලිනුතිට හොඳටම ඇඬුනා.
තාත්තාටත් ලිනුති ගැන හොඳටම
දුක හිතුණා.
එදා හීනෙනුත් ලිනුතිට ඉරුණු ගවුම
පෙනුනා. ලිනුති නින්දෙනුත් අඬන්න
පටන් ගත්තා.

අම්මාටත් තාත්තාටත් ලිනුති ගැන
හරිම දුක හිතුණා. පසුදා උදේ
අවදිවන විටත් ලිනුති හිටියේ
හරිම අසතුටින්. මුහුණ මැළවිලා ගිය
මලක් වගේ වෙලා තිබුණා.

අම්මා ලිනුතිව ළඟට ගත්තා. අරගෙන,
'' මගේ පුතේ, මම කියන දේ
හොඳින් තේරුම් ගන්න.

''මේ ලෝකේ තියෙන හැම දෙයක්ම කවදාහරි දවසක නැති වෙනවා, විනාශ වෙලා යනවා, අපි මොන තරම් ඒ දේට කැමති වුනත්, ඒ දේ දවසක විනාශ වෙන එක අපිට නවත්තන්න බෑ. අපි ඒ දේ තේරුම් අරගෙන, නැතිවෙන දේවල් ගැන වුනත් හිත හදා ගන්න පුරුදු වෙන්න ඕනි'' කියලා කියා දුන්නා.

ලිනුති, අම්මා ආදරයෙන් කියලා දුන්න ඒ කතාව තේරුම් ගත්තා.



ලිනුති අම්මාගෙන් ඉගෙන ගත්ත
අලුත් පාඩම ගස් වැල් වටලත්,
එයාගේ පූස් යාළුවාටත්, ලේනුන්ටත්,
කුරුල්ලන්ටත්, සමනලුන්ටත් කියලා
දුන්නා. ලිනුතිගේ හිතට සැනසීමක්
දැනුනා. ලිනුති ඉරුණු ගවුම ගැන
දුක් වෙන එක නැවැත්තුවා.







**ඩී.එම්. වෙනුති දුල්දිනි කුමාරි දිසානායක**
3 ශ්‍රේණිය ඩී
මහ/මහමායා බාලිකා විද්‍යාලය

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ එලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. .

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි.

තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන. .

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්